# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2021.04.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 මාර්තු

### මාර්තු මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**රටේ නිෂ්පාදන ක්‍රියාකාරකම් වඩා ඉහළ වේගයකින් යථාතත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2021 මාර්තු මාසයේදී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 67.0ක් ලෙස මාස 9ක් තුළ ලබාගත් ඉහළම අගය වාර්තා කරන ලදී.** නිෂ්පාදනය, නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම් උප දර්ශකවල ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**67.0**

**2021 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 7.6ක ඉහළ යෑමකි**

විශේෂයෙන්ම, ආහාර හා පාන වර්ග නිෂ්පාදන සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල නව ඇණවුම් සහ නිෂ්පාදනය උප දර්ශක වල සිදුවූ සැලකිය යුතු වැඩි වීම සමස්ත දර්ශකයේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක විය. අලුත් අවුරුදු උත්සව සමය ආසන්නවත්ම විකුණුම් මෙන්ම නිෂ්පාදනය ඉහළ ගිය බව ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ බොහෝ ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී. තවද, ඉදිරි උත්සව සමය වෙනුවෙන් ලබාදෙන නිවාඩු දින ආවරණය කිරීම සඳහා මෙම මාසයේදී සිය නිෂ්පාදනය වැඩි කළ බව රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදනයේ සිදුවූ වර්ධනයත් සමඟම තොග මිලදී ගැනුම් උප දර්ශකය ඉහළ යන ලදී. සේවා නියුක්තිය උප දර්ශකය ද වැඩි වේගයකින් ඉහළ යන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | පෙබ. | මාර්තු | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **59.4** | **67.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 60.6 | 73.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 61.7 | 72.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.2 | 56.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 58.3 | 72.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.9 | 53.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය 2021 මාර්තු මාසයේදී අඩු වේගයකින් වර්ධනය විය. බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කළේ නැව් භාණ්ඩ සැපයුම් සම්බන්ධ ගැටලු ක්‍රමයෙන් යථාවත් වීමත් සමඟ, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලයේ යම් පහළ යාමක් දක්නට ලැබුන බවයි. කෙසේ වුවත්, නැව් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ යාම ඔවුන්ගේ ලාභාන්තිකයට අහිතකර ලෙස බලපා ඇත.

රට තුළ මෙන්ම ප්‍රධාන අපනයන වෙළඳපොළවල ආර්ථික කටයුතු තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු පිළිබඳ වන අපේක්ෂාවන්ගේ උප දර්ශකය ඉහළ මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.1 කින් ඉහළ යමින් 2021 මාර්තු මාසයේදී 55.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2021 මාර්තු මාසයේදී එක්සත් රාජධානිය, යුරෝපා කලාපය සහ එක්සත් ජනපදයෙ හි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ඉහළ ගිය අතර ඉන්දියාව, රුසියාව සහ චීනයේ එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 අප්‍රේල් 12 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශය අඛණ්ඩව සිව්වන මාසයටත් වර්ධනයක් පෙන්නුම් කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 මාර්තු මාසයේ දී 62.1ක් දක්වා ඉහළ ගියේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්ති සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි දක්නට ලැබුණු ඉහළ යෑම් දායක විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා සහ තොග හා සිල්ලර වෙළඳාම යන උපඅංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ සේවා අංශයේ නව ව්‍යාපාර 2021 මාර්තු මාසයේ දී ඉහළ ගියේය.

සමස්තයක් ලෙස සෑම උප අංශයකම සිදු වූ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයන් සමඟ 2021 මාර්තු මාසයේ දී සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව සිව්වන මාසයටත් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන්, ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රගතියට අනුකූලව මූල්‍ය සේවා උප අංශය මාර්තු මාසයේ දී තවදුරටත් වර්ධනයක් වාර්තා කළේය. උත්සව සමයත් සමඟ තොග හා සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහන උප අංශ ද තවදුරටත් වර්ධනය විය. මීට අමතරව, අනෙකුත් පෞද්ගලික සේවා උප අංශයද 2021 මාර්තු මාසයේ දී වර්ධනයක් අත්කර ගත්තේය. මේ අතර, අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග වලින් අනතුරුව උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉල්ලුම වැඩිවීමත් සමඟ අධ්‍යාපන උප අංශයේද අඛණ්ඩ වර්ධනයක් වාර්තා විය.

වර්ධනය වන ව්‍යාපාර ක්‍රියාකාරකම් මධ්‍යයේ නව බඳවා ගැනීම් සිදු කිරීම හේතුවෙන් අඛණ්ඩව මාස 13ක් පහත වැටීමෙන් පසු, පළමු වරට, සේවා නියුක්තිය 2021 මාර්තු මාසයේ දී ඉහළ ගියේය.

COVID-19 වසංගතය හා සම්බන්ධ සෞඛ්‍ය අවදානම හේතුකොටගෙන, අඩු මට්ටමක පැවති සේවයට වාර්තා කිරීම් ඉහළ යෑමත් සමඟ නිමකිරීමට නියමිත කාර්යයන් 2021 මාර්තු මාසයේ දී අඛණ්ඩව දෙවන මාසයටත් පහළ යන ලදී.

| විචල්‍යය | පෙබ. | මාර්තු | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **56.5** | **62.1** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 54.1 | 64.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 62.8 | 73.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.5 | 52.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.8 | 49.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 69.6 | 70.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සිංහල හා දෙමළ අලුත් අවුරුදු සමය සහ රාමසාන් උත්සව සමය හේතුකොටගෙන ව්‍යාපාර කටයුතු වර්ධනය පිළිබඳව පවතින සුබවාදී අපේක්ෂාවන් හේතුවෙන් 2021 මාර්තු මාසයේ දී ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර කටයුතු පිළිබඳ අපේක්ෂාවන් තවදුරටත් ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**62.1**

**2021 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.6ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 පෙබරවාරි මාසයේ පැවති 52.8 සිට 2021 මාර්තු මාසයේ දී 54.7 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 මාර්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 අප්‍රේල් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.